කතනමින් කෘත්‍යය නොකළ යුතුය. 8. පුසන්කුරෙන් පිසදැමිය යුතු. 9. ආචමනයේ දී ශබ්දය නොවිහිදෙනසේ ද ජලය නොඉසෙනසේ ද එය කළ යුතුය. 10. පුසන්කුරු වලේ නොදැමිය යුතුය. 11. වර්චස් පිටත නොදැමිය යුතුය. 12. අනුන්ගෙන් හෝ තමන්ගෙන් පිටත ගැවී ඇති ඒවා සෝදා දැමිය යුතුය. 13. පස්සාව පාදුකාවේ කෙළ නොගැසිය යුතුය. 14. ඉක්මනට මේවා නොකළ යුතුය. 15. සිවුරු දමන ලනු ආදියක සිවුර දමා වැසිකිළියට වැදිය යුතුය. 16. දැහැටි කමින් කෘත්‍යය නොකළ යුතු. 17. රළු පුසන්කුරු නොගත යුතු. 18. වැසිකිළි- කැසගිළි කෘත්‍යය කොට නැගිට අඳනය පහත දමා එයින් ඉවත්විය යුතු. 19. ආචමනයට ගත් ජලය භාජනයේ ඉතුරු නොකළ යුතුය. (සාධාරණ තැනේදී පමණයි.) 20. රෝගයකින් පෙළෙනවිට වරද නැති.

---

පරිහරණය සෙනසුන තුල පමණයි
Ot 33

# නිවේදනය.

1951 ජූනි මස 18 වෙනි දිනට පත් පොසොන් පුණු පොහෝද- දෙල්දූවේ විවේකාරාමයේදී- අතිගරු පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මහාස්ථවිර ස්වාමිපාදයාණන් වහන්සේ විසින්- ප්‍රථම වරට ලක්දිව නානා පළාත්වලින් තෝරාගන්නා ලද යෝගාවචරයින් දොළොස්දෙන සසුන්ගත කරවීමේ උදාරතර මහා පුණ්‍යකර්මයේ ප්‍රමුඛත්වය ඉසිලීමේ භාග්‍යය ලත්- අම්බලම්ගොඩ ශ්‍රී සද්ධර්මප්‍රකාශක සමිතිය, එය සිහිපත්වීම නිමිත්තකොට දිනචරියාදි සංග්‍රහ නමැති මෙම විනය පුස්තකය සමිතියෙහි සම්පාදකයන් වන පහත නම් සඳහන් අප විසින් මුද්‍රණය කරවා යෝගාවචරයින්ගේ ප්‍රයෝජනය සඳහා පූජාකරණ ලදී.

නිබ්බාණ පච්චයො හොතු.

මීට,
අම්බලම්ගොඩ ශ්‍රී සද්ධර්මප්‍රකාශක සමිතියේ
සම්පාදකයන් වන,

| | |
|---|---|
| ඈස්. ජ්. ද සිල්වා | ඩී. එච්. ඈල් ගුණවර්ධන |
| ඈම්. පී. බේරුවලගේ | ඈස්. ඈම්. ඩී. ද සිල්වා |
| ඩබ්ලිව්. ජේමදාස | ජී. එච්. ඩී. සුගුණපාල |

යන අපි වම්හ.

බු. ව. 2495
ක්‍රි. ව. 1952
අම්බලම්ගොඩ දීය.

පරිහරණය සෙනසුන තුළ පමණයි

# දිනචරියා

තිභවෙසු ගතිං ඤත්වා - ධම්මරාජ මනුත්තරං
පවක්ඛාමි සමාසෙන - දින චාරිත්ත සඞ්ගහං.

අජරාමර නිබ්බානත්ථිකෙන සුගත සාසනෙ නික්ඛන්ත කුලපුත්තෙන අරුණුග්ගමනතො පුරෙතර මුට්ඨාය දන්ත කට්ඨ ඛාදනාදිකං සබ්බං සරීර කිච්චං නිට්ඨපෙත්වා සික්ඛාකරණීයෙ වුත්ත නයෙන සක්කච්චං නිවාසෙත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා පරිවෙණං සම්මජ්ජිත්වා පානීයං පරිභොජනීයං උපට්ඨ-පෙත්වා විවෙකට්ඨානෙ නිසජ්ජ අත්තනො සීලං ඔලොකෙත්වා එවෙක වත්තං පූරෙත්වා "සතං හත්ථී සතං අස්සා" ති ආදිනා වුත්ත පද වීතිහාරානිසංසෙ ලභිස්සාමීති ච.

"වත්තං න පරිපූරෙන්තො - න සීලං පරිපූරති,
අසුද්ධ සීලො දුප්පඤ්ඤො - දුක්ඛා න පරිමුච්චතී"ති

වචනතො වත්තං පූරෙන්තො සීලං පූරති. තස්මිං පූරිතෙ දුක්ඛතො මුච්චිස්සති. තස්මා සකල සංසාරදුක්ඛතො මුත්තියා සීලං පූරෙන්තෙන සම්මජ්ජනාදි වත්තං පූරෙතබ්බන්ති ච, යොනිසො විමන්තෙත්වා, අවිජහිත මෙත්තා කම්මට්ඨානිකෙන, "අඤ්ඤෙසු මෙ ආතප්පං කරණීයොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බන්ති" වුත්තත්තා, විසමභූමියං පාජියමානං සුපූරිතොදක ඝටහරිත සකටම්ව නිච්චලෙන සන්තිට්ඨියෙන සන්ත මානසෙන සුගම්භීරදෙසෙන චෙතියඞ්ගණ සමීපං උපසඞ්කම්ම පාදෙ ධොවිත්වා සම්මුඛාජිනං ගහෙත්වා ධරමානක බුද්ධ මුපසඞ්කමන්තෙන විය ගරු චිත්තීකාරෙන චෙතියඞ්ගණං පත්වා මාලකං සම්මජ්ජිත්වා නානා දිසා විලොකනං අකරොන්තෙන තෙනව අභණන්තෙන භගවතො නව අරහාදි ගුණෙ සමනුස්සරන්තෙන පුප්ඵාදි පූජනීය වත්ථු මඤ්චෙ; පූජෙත්වා තික්ඛත්තුං පදක්ඛිණං කත්වා, මහන්තං චෙතියං චෙ, සොළසට්ඨානෙසු, ඛුද්දකං චෙතියං අට්ඨසු ඨානෙසු ඨත්වා වන්දි-තබ්බං.

මහාබොධි ච වුත්ත නයෙන උපසඞ්කමිත්වා, මාලකං සම්මජ්ජිත්වා බොධිමූලෙ උදකං ආසිඤ්චිත්වා, නානාදිසා අනොලො-කෙන්තෙන තෙනව අභණන්තෙන නව අරහාදයො බුද්ධ ගුණෙ අනුස්සරන්තෙන, "තාදිසස්ස ලොකනාථස්ස උපකාරකො අයං බොධී"ති ගුණං සල්ලක්ඛෙන්තෙන භගවති කාතබ්බ මාදරං

කත්වා, පූජනීය වත්ථු අත්ථි චෙ, පූජෙත්වා; වුත්තනයෙන පදක්ඛිණං කත්වා සොළසසු වා අට්ඨසු වා ඨානෙසු ඨත්වා වන්දිතබ්බං; තතො බුඩ්ඪ සබ්‍රහ්මචාරිකෙ භික්ඛූ වන්දන්තෙන, "අනුජානාමි භික්ඛවෙ යථාබුඩ්ඪං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං, සාමීචිකම්ම"න්ති භගවතා වුත්ත පටිපත්තිං පූරෙස්සාමීති ච වා,

"අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධා පචායිනො,
චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයුවණ්ණො සුඛංබල"න්ති

වුත්තෙ චත්තාරො ආනිසංසෙ ච ලභිස්සාමී'ති චින්තෙත්වා; පඨමං "වන්දාමි භන්තෙ"ති වත්වා උභොපාදෙ සමං ඨපෙත්වා උජුකං ඨත්වා, "ඊදිසානං චතුපාරිසුද්ධි සීලෙ පතිට්ඨිතානං අප්පිච්ඡ- සන්තුට්ඨ- සල්ලෙඛගුණ යුත්තානං පරම පුඤ්ඤක්ඛෙත්ත භූතානං මහා- පුඤ්ඤවන්තානං දට්ඨුඤ්ච වන්දිතුඤ්ච ලද්ධ භාවො උත්තමො"ති චින්තෙත්වා, සඤ්ජාත පීති සොමනස්සෙන හුත්වා බුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දන්තෙන පෙමඤ්ච ගාරවඤ්ච උපට්ඨපෙත්වා උභොහි පාණිතලෙහි පාදෙ සම්බාහන්තෙන "පාදෙ වන්දිතබ්බා"'ති වුත්ත- විධිනා වන්දන්තෙන ආචරියුපජ්ඣායෙසු ච බුඩ්ඪ සබ්‍රහ්මචාරිසු ච වත්තං පූරෙත්වා, තිථි - වාර - නක්ඛත්තෙ ච බුද්ධ වස්සඤ්ච කථෙත්වා; යාගු අත්ථි චෙ, භොජන සාලං පවිසිත්වා,

"සල්ලෙඛං අච්චජන්තෙන - අප්පමත්තෙන භික්ඛුනා,
කප්පියෙ'පින කාතබ්බා - ආමිසස්ථාය ලොලතා"ති

වුත්තො වාදං මනසි කරොන්තෙන කප්පියෙ'පි පච්චයෙ ලොලුප්ප මනුප්පාදෙත්වා, සම්පත්තා සතෙ නිසජ්ජ, සක්කච්චං යාගු පටිග්ග- හෙත්වා තතො රතනත්තයං පූජෙත්වා, පඨමං පටික්කූල වසෙන පච්චවෙක්ඛිත්වා, තදනන්තරං "පටිසඞ්ඛා යොනිසො"ති ආදිනා පච්චවෙක්ඛිත්වා යාගුං පිවිත්වා පත්ත ථාලකෙසු ච භොජනසාලාය ච පූරෙතබ්බ වත්තං ඛන්ධකෙ වුත්තනයෙන පූරෙතබ්බං.

තතො, "තස්ස පාසාදිකං හොති පත්තචීවරධාරණං"න්ති ආදිකං මනසි කරොන්තෙන පත්තචීවරං ගහෙත්වා අවිජහිත කම්මට්ඨානිකෙන ගාමප්පවෙසන කාලෙ ආචරියුපජ්ඣායානං නාතිදූරෙන නාච්චාසන්නෙන ගන්ත්වා චීවර පාරුපනට්ඨානං සම්මජ්ජිත්වා, පාරුතචීවරස්ස ආචරියස්ස පත්තං දත්වා, සික්ඛා කරණීයෙ වුත්තනයෙන සක්කච්චං නිවාසෙත්වා පාරුපිත්වා පච්ඡා සමණෙන හුත්වා, ඉත්ථි පුරිස හත්ථි අස්සාදයො අනාලොකෙන්තෙන සික්ඛා කරණීයෙ වුත්තනයෙන පිණ්ඩචාරික වත්තං පූරෙත්වා ගාමතො නික්ඛම්ම ආචරියස්ස පත්ත චීවරං පටිග්ගහෙත්වා



කම්මට්ඨානං මනසිකරොන්තෙන විහාරං පවිසිත්වා පත්ත චීවරං ඨපෙත්වා ආසන පඤ්ඤපන- පාදොදක- පාදපීඨ- පාදකඨලිකා ඨපන විජනිකම්ම පානීයසරාව දන්තකට්ඨ දනාදි සබ්බ වත්තං නිට්ඨපෙත්වා, පත්තපරියා පන්නතො ආචරියස්ස දත්තං දත්වා සෙනාසනං පච්චවෙක්ඛිත්වා තත්ථ නිසජ්ජ සික්ඛා කරණීයෙ වුත්ත- නයෙන අලොපෙ ආලොපෙ පච්චවෙක්ඛන්තෙන ආහාර කිච්චං නිට්ඨපෙත්වා, පත්තෙ ච හත්ථෙ ච ආචරියුපජ්ඣායෙසු ච පූරෙතබ්බ වත්තං පූරෙත්වා විවෙකට්ඨානෙ නිසජ්ජ අතීත පච්ච- වෙක්ඛණං කත්වා අත්තනො සීලං ඔලොකෙත්වා, තදනන්තරං ගන්ථධුර මනුයුඤ්ජන්තෙන ගන්ථධුරඤ්ච, විපස්සනා ධුර මනුයුඤ්ජන්තෙන විපස්සනා ධුරඤ්ච යාව සූරියත්ථඞ්ගමනා සාදරං පූරෙතබ්බං.

අථ චාරප්පත්තෙන සරීර පටිජග්ගනං කත්වා අග්ගි මූපට්ඨ- පෙත්වා දීපං ජාලෙත්වා ධම්මාසන පඤ්ඤපනෙන පුබ්බෙ වුත්ත- නයෙන චෙතියඞ්ගණ - බොධියඞ්ගණ - ආචරියුපජ්ඣාය බුඩ්ඪ සබ්‍රහ්මචාරිසු පූරෙතබ්බ වත්තං පූරෙත්වා ධම්මං සුත්වා, පරිත්තං භණිත්වා පුච්ඡිතබ්බ පඤ්හං අත්ථි චෙ පුච්ඡිත්වා අත්තනො ච සන්තක සෙනාසනං ගන්ත්වා, සජ්ඣායිතබ්බං ධම්මං සජ්ඣායන්තෙන පඨම යාමං ඛෙපෙත්වා, චතුරාරක්ඛා මනසි කත්වා "පච්ඡිම යාමෙ සම්පත්තෙ උට්ඨහිස්සාමී"ති සම්පජඤ්ඤ පුබ්බඞ්ගමං නිද්දං උපගම්ම, යථා පරිච්ඡෙදං උට්ඨාය අතීත පච්චවෙක්ඛණං කත්වා චතුරාරක්ඛා- රතන සුත්ත- මෙත්ත සුත්තාදිකං භණිත්වා පුබ්බෙ වුත්ත සබ්බ වත්තානි සම්පාදෙන්තෙන දිවසස්ස චික්ඛත්තුං මෙත්තා පරිත්තං අට්ඨ සංවෙග වත්ථු, අසුභ සතිං මරණ සතිං දසධම්ම සුත්තං ච මනුස්සත්තාදි දුල්ලභතරතං ච මනසිකරොන්තෙන ඡන්දාදි අගති ගමනං පහාය දිට්ඨ දොසෙ අඤ්ඤ මඤ්ඤං චොදෙන්තෙන සාරෙන්තෙන මෙත්තා වචීකම්මං පූරෙත්වා.

"යො පන භික්ඛු ධම්මානුධම්ම පටිපන්නො විහරති සාමීචි පටිපන්නො අනුධම්මචාරී, සො තථාගතං සක්කරොති, ගරු කරොති, මානෙති පූජෙති පරමාය පූජාය"ති භගවතා වුත්තො- වාදං මනසි කත්වා, එවං සම්මා සම්බුද්ධං පටිපත්තියා පූජෙන්තෙන එතං යථාවුත්ත දිනචාරිත්තං පූරිතම්හි පුච්ඡිතෙන තුණ්හී භාවෙන ච ගෙලඤ්ඤාදිනා යෙන කෙනචි අථාසුකෙන අපූරිතෙන තස්ස කාරණ කථෙන්තෙන ච පමාදෙන අකතෙ චෙතියඞ්ගණෙ වාලිකං ඔකිරන්තෙන දණ්ඩකම්ම කරණෙන ච, සබ්බදා සමග්ගෙන සමොදමානෙන ඉමං දිනචරියං පසංසන්තෙන සබ්‍රහමචාරීනං චීවර සිබ්බනරජන පත්තපචනාදීසු උච්චාවච කරණීයෙසු

කුසලෙන උජුවිපන්නෙන සුබ්බචෙන පාදපුඤ්ජනී සමෙන නිහතමානෙන චෙතසාවතුසු පච්චයෙසු අලොලුප්පෙන වාදස පරික්කාරනො අධිකං අගගණ්ඩනෙනන සල්ලහුකවුත්තිනා සන්තින්ද්‍රියෙන සන්ත මානසෙන කරුණා පඤ්ඤ සමඩ්ගිනානුභාවා, කායගබ්බච්චිගබ්භාන මහාවෙන කුලෙසු අනුපලිතෙනන අප්පමත්තකං වෙ පි පාපං අකාරොන්තෙන එවං පටිපත්ති පූජාය පූජ්‍යනෙනන ලොකිය ලොකුත්තර සුඛං සම්පාදෙතබ්බන්ති.

භා ව ය.

භවත්‍රයට එකම පිහිට වූ උතුම් ධර්මරාජයාණන් වැඳ දින චාරිත්‍ර සඞ්ග්‍රහය සැකෙවින් කියමි.

අජරාමර නිවන් කැමැති බුදුසසුන් වන් කුල දරුවා විසින් අරුණට පළමු නැගිට, දැහැටි වැළඳීම් ආදි සියලු සිරුරුකිස නිමවා, සෙබියාවෙහි කී නයින් සකස් කොට හැඳ නතිපොට සිවුර එකාංශ කොට පොරවා, පිරිවෙන හැමැද, පානීය- පරිභොජනීය ජලය (පෙරා) තබා, විවේක ස්ථානයක හිඳ තමාගේ ශීලය ආවර්ජනා කොට, විවේක වත් පුරා, "සතං භන්තේ සතං අස්ස" යනාදීන් කියන ලද පද වීතිහාරානිසංසයන් ලබන්නෙමැයි ද, "වත් නොපුරන්නා සිල් නොපුරයි. නොපිරිසිදු සිල් ඇති නුවණ නැති තැනැත්තා දුකින් නොමිදේ" යයි වදාළ හෙයින් වත් පුරන්නා සිල් පුරයි, එය පිරූ කල්හි දුකින් මිදෙයි, එහෙයින් සියලු සසර දුකින් මිදීමට සිල් පුරන්නා විසින් හැමදීම් ආදි වත් පිරිය යුතු යයි ද, නුවණින් සිතා, නොහරන ලද මෛත්‍රී කර්මස්ථාන ඇතිව, "මා විසින් ගිහින්හට වෙනස්වූ ක්‍රියා කලාපයක් පැවැත්විය යුතු යයි පැවිද්දා විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කළයුතුය"යි වදාළ හෙයින්, නොසම බිමක පදින පිරුණු කළයෙන් බරවූ ගැලක්සේ නිශ්චලවැ, සන්සුන් ඉඳුරන් ඇති වැ, සන්සුන් හිත් ඇති වැ, වියදඬු පමණ දුර බැලුම් ඇති වැ, දාගැප්මලුව ළඟට පැමිණ පා සෝදා මූස්න ගෙන ජීවමාන සර්වඥයන් වහන්සේ වෙත එළඹෙන්නා සේ ගෞරවාදර ඇති වැ, දාගැප්මලුවට පැමිණ මලුව හැම ද, නොයෙක් දිශාවන් නොබලමින් කිසිවකු හා කථා නොකරමින්, භාග්‍යවතුන් වහන්සේගේ නව අරහාදි ගුණයන් සිහිකරමින්, මල් ආදි පිදිය යුතු වස්තුවක් ඇතොත් එය පුදා තුන් යලක් පැදකුණු කොට ලොකු දාගබක් නම් සොළොස් තැනක ද, කුඩා දාගබක් නම් අට තැනක ද සිට වැඳිය යුතුය. බෝධීන් වහන්සේ වෙතට ද යට කියන ලද ක්‍රමයෙන් එළඹ මලුව හැම ද, බෝමුලෙහි පැන් ඉස නොයෙක් දිශාවන් නොබලමින් කිසිවකු සමගත් කථා නොකරමින් නව අරහාදි බුදුගුණයන් සිහිකරමින්, "එබඳු ලෝකනාථයන්



වහන්සේට උපකාරවූයේ මේ බෝධි රාජයා"යයි ගුණය සලකමින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි කළයුතු ආදරය කොට පිදියයුතු දෙයක් ඇත්නම් පුදා කියන ලද ක්‍රමයෙන් පැදකුණු කොට, සොළොස් තැනක හෝ අට තැනක සිට වැන්ද යුතුය. ඉක්බිති වැඩිමහලු සබ්‍රම්සරුන් වඳින්නා "මහණෙනි! වැඩිමහලු තම්සේ අභිවාදනය, හුනස්නෙන් නැගී සිටීම, අඤ්ජලිකර්මය, සාමීචිකර්මය අනුදනිමි"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ ප්‍රතිපත්තිය පුරන්නෙමැයි ද, නොහොත් අභිවාදනය කරන්නාවූ නිතර වැඩිහිටියන්හට සලකන්නාවූ ද තැනැත්තාට ආයුවණ්ණ- සුඛ- බල යන කරුණු සතර වැඩේ'යයි වදාළ අනුසස් සතර ලබන්නෙමැ යි හෝ සිතා, පළමු කොට, "ස්වාමීනි! වඳිමි"යි කියා පාදෙක සම කොට තබා කෙළින් සිට ගෙන, "මෙබඳුවූ සිව්පිරිසිදු සිල්හි පිහිටි අප්පිච්ඡවූ සන්තුට්ඨිය ඇති සල්ලෙඛගුණ යුක්තවූ සැබෑ පින් කෙත් වූ මහ පිනැතියන් දැකීමටත් වැඳීමටත් ලැබීම උතුම්" යයි සිතා හටගත් පීති සොම්නස්ස ඇතිවැ වැඩිමහලු භික්ෂූන් වහන්සේගේ පා ප්‍රේමය ද ගෞරවය ද උපදවා දෙඅත්ලෙන් පිරිමදිමින් වැඳිය යුතුයයි වදාළ ක්‍රමයෙන් වඳිමින්, ආචාර්ය- උපාධ්‍යාය- සබ්‍රහ්ම චාරීන් විෂයෙහි කළමනා වත් පුරා, තිථි- දින- නැකත් හා බුද්ධ වර්ෂය කියා කැඳක් ඇත්නම් බොජුන් හලට ගොස් "සල්ලෙඛගුණය නොහරිනා නොපමා භික්ෂුව විසින් කැපදෙයෙහි ද ආමිසය සඳහා ලොල් කමක් නොකළ යුතු"යයි වදාළ අවවාදය මෙනෙහි කරමින් කැප පසෙහි ද ලොල්කමක් නූපදවා පැමිණි අස්නෙහි හිඳගෙන සකස්ව කැඳ පිළිගෙන එයින් තුනුරුවනට පුදා පළමුවෙන් පිළිකුල් වසයෙන් ප්‍රත්‍යවෙක්ෂා කොට, දෙවනුව "පටිසඞ්ඛා යොනිසො" යනාදීන් පස්විනා කැඳ වළඳා, පා තලුතැටි ආදියෙහි ද බොජුන් හලෙහි ද පිරියයුතු වත් බන්ධනයෙහි වදාළ නියායෙන් පිරියයුතුය.

ඉක්බිති "පාසිවුරු ධැරීම ඔහුට ප්‍රසාදය එළවන්නේ වේ" යනාදිය මෙනෙහි කොට පාසිවුරු ගෙන නොහළ කමටහන් ඇති වැ ගම්වදින කාලයෙහි ආචාර්‍ය - උපාධ්‍යායයනට නුදුරු වැ තොළං වැ ගොස්, සිවුරු පොරෝනා තැන හැමැද සිවුරු පෙරවූ ආචාර්යයනට පාත්‍ර දී, සෙඛියාවේ කී සෙයින් සකස් කොට හැඳ පෙරව ගෙන පවත්නා සමණ වී ස්ත්‍රී - පුරුෂ - හස්ති - අශ්වාදීන් නොබලමින් සෙඛියාවේ කී ලෙසින් පිණ්ඩචාරිකවත සපුරා, ගමින් නික්මී ආචාර්යයන්ගේ පාසිවුරු පිළිගෙන කමටහන් මෙනෙහි කරමින් වෙහෙරට පිවිස, පාසිවුරු තබාලා, අසුන් පැනවීම්, පා ධෝනා ජලය, පාපුටු, පානබත පුවරු තැබීම්, පවන් සැලීම්, දැහැටි පිළිගැන්වීම්, පැන් බඳුන් පිළිගැන්වීම් ආදි සියලු වත් නිමවා පාත්‍ර

පර්යාපන්න දෙයකින් ආචාර්යයනට පුද, සෙනාසනය ප්‍රත්‍යවෙක්‍ෂා කොට එහි හිඳ, සෙඛියාවේ වදාළ ක්‍රමයෙන් බත් පිඩක් පාසා ප්‍රත්‍යවෙක්‍ෂා කරමින් අහර කිස නිමවා, පාත්‍රයෙහි ද හත්තගයෙහි ද, ආචරිය උපජ්ඣායයන් විෂයයෙහි ද පිරියයුතු වත් පුරා, විවේකස්ථානයෙහි හිඳ අතීත ප්‍රත්‍යවෙක්‍ෂාව කොට තමාගේ සීලය බලා, අනතුරු ව ග්‍රන්ථධුරයෙහි යෙදෙන්නා විසින් එය ද, විදර්ශනාධුරයෙහි යෙදෙන්නා විසින් ඒ ධුරය ද හිරු ගිලෙන තෙක් පිරිය යුතු.

ඉක්බිති චාරය පැමිණියහු විසින් සිරුරු පිළිදගුම් කොට ගිනි සපයා පහන් දල්වා ධර්මාසනය පනවා පෙරකී ක්‍රමයෙන් දැගැබ් බෝ මලු ආචාර්ය උපාධ්‍යාය සබ්‍රහ්මචාරීන් විෂයයෙහි පිරිය යුතු වත් පුරා බණ අසා පිරිත් කියා ඇසියයුතු පැනක් වෙතොත් අසා, තමා සතු සෙනස්නට ගොස් සජ්ඣායනා කළයුතු ධර්මයන් සජ්ඣායනා කෙරෙමින් ප්‍රථම යාමය ගෙවා චතුරාරක්‍ෂාවත් මෙනෙහි කොට "පශ්චිමයාමය පැමිණි කල්හි නැගිටිමි" යි මනා නුවණ පෙරදැරි කොට ඇති නින්දට එළඹ, නියමිත කාලයෙහි නැගිට අතීත පස්විකුම් කොට සිවු අරක්, රුවන් සුත්, මෙත් සුත්, ආදිය කියා, පෙර කියන ලද සියලු වත් සපයමින් දවසට තුන් වරක් මෙත් පිරිත් අට්ඨ සංවෙග වත්ථු, අසුභ සති, මරණ සති දසධම්මසුත්තයන්ද, මනුෂ්‍යාත්මභාවාදිය අතිශය දුර්ලභ බවද මෙනෙහි කරමින් ඡන්දාදීන් අගති ගමන දුරු කොට දුටු වරදෙහි ඔවුනොවුන් චෝදනා කරමින් සිහි කරවමින්, මෙත්තාවචී කර්මය පුරා,

"යම් මහණෙක් ධර්මයට අනුව පදිනුයේ වෙසෙයිද, සාමීචි පටිපන්න වෙයිද, අනුධර්මයෙහි හැසිරෙන්නේද, හෙතෙම තථාගතයනට සත්කාර කෙරෙයි, ගුරුකාර කෙරෙයි, මානනය කෙරෙයි, නියම පූජායෙන් පූජා කෙරෙයි"

යන භාග්‍යවතුන් වහන්සේ වදාළ අවවාදය මෙනෙහිකොට, 'මෙසේ සම්බුදුන් ප්‍රතිපත්ති පූජායෙන් පුදන්නහු විසින් "මේ දිනචරියා පුරන ලද දැ"යි විචාළ කල නිශ්ශබ්ද වීමෙන් ද, ගිලන් කම් ආදි යම් කිසි අපහසු වෙකින් නො පිරූ කල්හි එයට කාරුණු කීමෙන් ද පමාවෙන් නොකිරීම නිමිත්තෙන් දැගැබ් මලුවෙහි වැලි දැමීමෙන් ද, දඬුවම් කිරීමෙන් ද හැම කල්හි සමගි ව සතුටුවෙමින් මේ දිනචරියාවට පසසමින් සබ්‍රම් සරුන්ගේ සිවුරු මැසීම, පඬු ගැසීම, පාත්‍ර දුම් ඇල්ලීම ආදි කුඩා මහත් වැඩෙහි දක්‍ෂ ව, ඉදිසිත් ඇති ව, සුවච ව පාපිස්නා කිස්සක්සේ මත් නැති සිතින් සිවුපසෙහි ලොල් නොවී දෙළොස් පිරිකරට වැඩියක් නොගනිමින්



සැහැල්ලු පැවැතුම් ඇති ව, සන්සුන් ඉඳුරන් ඇති ව, සන්සුන් සිත් ඇති ව, කරුණා - ප්‍රඥා දෙකින් යුක්තව, කායගම් වචීගම් නැති ව, කුලයන්හි නොඇලී ස්වල්පවූ පාපයක් පවා නොකිරීමෙන් මෙසේ ප්‍රතිපත්ති පූජාවෙන් පුදමින් ලොවී ලොවුතුරා සැප සිඳා කටයුතු.

**දිනචරියා සංග්‍රහයයි.**

---

# යොගාශ්‍රමීය කතිකාවත

"ස්වාක්ඛාතං බ්‍රහ්මචරියං - සන්දිට්ඨික මකාලිකං
යත්ථ අමොඝා පබ්බජ්ජා - උත්තමත්ථස්ස පත්තියා"

"යාය සද්ධා පබ්බජිතො - අගාරස්මා නගාරියං,
තමෙව සද්ධං බ්‍රෑහෙහි - මාකාමස්ස වසංගමි"

1. ශාන්ති රසයෙන් රසවත් සම්බුදු සසුන් වන් කුල දරුවන් විසින් උත්තරීතරවූ ශාශ්වත පරමාර්ථය හඳුනා ගෙන ඒ උතුම් බලය අධ්‍යාත්මයෙහි සඤ්ජාත- පොෂණය සඳහා සමාරාධනය මෙහි පරමාධ්‍යාශය විය යුතු.

2. "සද්ධො මහානාම ආරාධකො හොති නො අස්සද්ධො" යනාදීන් වදාළ පරිදි යථොක්ත ගුණ විශෙෂය ලැබ ගැනීමට සද්ධා- සති- විරිය- සමාධි- පඤ්ඤා යන ගුණ පොෂණය කළයුතු.

3. ලාභ කීර්ති ප්‍රශංසා කාමතාදී අශාසනික අදහසින් තොර ව ශාශ්වත පරමාර්ථයන් හදාළ ශ්‍රද්ධාදි ගුණ සම්පන්න වූ නොපසුබට වීර්‍ය ඇති ජීවිත පරිත්‍යාගයෙන් අභිමුඛ වූ භික්‍ෂු පිරිසකගෙන් ද, ශාශ්වත පරමාර්ථයන් වෙත සිත් දුන්, සම්බුද්ධ දෙශිත ප්‍රතිපත්ති මාර්ගය ක්‍රියාත්මක කොට දැක්වීමෙහි ප්‍රාර්ථනාව ඇති, පරිත්‍යාග ශීලී ගුණ නුවණැති ආධාර කාරක මණ්ඩලයෙකින් ද, එයට සුදුසු පරිසරයකින්ද මෙම යොගාශ්‍රමසංස්ථාව සම්පූර්ණ විය යුතු.

4. සික්ඛා සාජීවයෙන් සමාන වූ සම සම්භොග පිරිසක් වූ මෙහි නිත්‍යාවාසී ශිෂ්‍ය සමූහයා ප්‍රතිපත්තිය පිළිබඳ විවිධ මතභෙදයෙන් තොර වූ සමග්ග - සම්මොදමාන පිරිසක් වියයුතු.

5. මෙම උදාර ව්‍යාපාරයට හේතු සම්පන්න භව්‍ය පුද්ගලයන් ම ඇතුළත් කරගත යුතු හෙයින් මෙහි කරන හැම පරීක්‍ෂණයක් ම සියුම් ලෙසිනුත් සම්පූර්ණ ලෙසිනුත් පැවැත්විය යුත්තේය.

6. චීවර ධාරණාදි කුඩා මහත් පැවතුම් හා පරිෂ්කාරයන්ගේ වෙනස්කම් නිසා නොයෙක් විවාද පහළ වීමට ඉඩ ඇති වන හෙයින් ද, එයින් උත්තමාර්ථය වැළකී යාමට හේතු පැනෙන හෙයින් ද, සමාන ගති- සිරිත්- විරිත් ඇති පිරිසක් විය යුතු.

7. ගිහි පැවිදි කා විසින් වුවද තමාගේ මහත් කම් උසස් කම් දක්වා අලංකාරයම සඳහා භික්ෂූන් යොදා කරන පින්කම් වලට මෙහි භික්ෂු පිරිස සම්බන්ධ නොවිය යුතු.

8. මෙහි පැවැත්වෙන අධ්‍යාපන ක්‍රමයට බාධක කිසිම පින්කමකට හෝ උත්සවාදියකට මෙහි පිරිස සම්බන්ධ නොවිය යුතුය.

9. ආරණ්‍යක භික්ෂු ප්‍රතිපත්තියට සරිලන හැම අධ්‍යාපනයක් ම දිය යුතු වන හෙයින් යොගාභ්‍යාසාශ්‍රමයන්හි ද යොගාශ්‍රමයන් හා සමාන පැවැතුම් දියුණු කළ යුතුය.

10. නියම කල්‍යාණාධ්‍යාශයයෙන් උත්තමාර්ථය ලබා ගැනීම වන හෙයින් පිරිසුදු පැවතුම් දියුණු කරමින් කොහොන් කම්, වංචක බව, චාටු කථාදිය සම්පූර්ණයෙන්ම දුරලිය යුතුය.

11. **එව මෙව ඛො රාජකුමාර! පඤ්චිමානි පධානියඞ්ගානි ඉධ රාජ කුමාර! භික්ඛු සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං, ඉතිපි සො භගවා අරහං -පෙ- භගවාති අප්පාබාධො හොති අප්පාතඞ්කො, සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො හොති, නාති සීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය, අසඨො හොති අමායාවී. යථාභූතං අත්තානං ආවිකත්තා; සත්ථරිවා විඤ්ඤූසු සබ්‍රහ්මචාරිසු. ආරද්ධ විරියො හොති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හ පරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු, ධම්මෙසු පඤ්ඤවා හොති උදයත්ථ ගාමිනියා පඤ්ඤාය සමන්නාගතො, අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛය ගාමිනියා; ඉමානි ඛො රාජ කුමාර පඤ්චපධානියඞ්ගානි** යන මජ්ඣිම නිකායේ බොධිරාජ සූත්‍රයේ වදාළ භාවනානුයෝගී භික්ෂුවකට අවශ්‍ය කරුණු පරීක්ෂාකොට බලා එයින් සම්පූර්ණ වීමට උත්සාහ වැඩිය යුතුය.

12. "**පබ්බාජේනෙනා'පි සොධෙත්වා පබ්බාජෙථ**" යි වදාළ හෙයින් පැවිද්ද ලබා ගන්නට පැමිණියන් වුවහොත්, ඔහු ගැන මනා දැනීමක් ඇතිකර ගැනීමට ප්‍රවේශිකා පරීක්ෂණයක් පවත්වා එයින් සමර්ථවූවකු දසසිල් ඈ ශීල ධර්මයෙක පිහිටුවා පණ්ඩු පලාසයකු වශයෙන් සුදුසු තැනක නවත්වා හෙරණ බණ දහම් හා වත් පිළිවෙත් ආදිය පුහුණු කරවා පරීක්ෂණයෙන් සමර්ථ වූවහු ම පැවිදි කළ යුතුය.



13. මහණ කමට නුසුදුසු ප්‍රව්‍රජ්‍යා දෝෂාදියෙන් හෝ පින් ගුණ නැති අනුවණ සැදැහැ නැති කුසීත කම් ආදි අභාග්‍යයෙකින් යුක්තවූවන් පණ්ඩු පලාස පන්තියෙන් ඉවත් කළ යුතුය.

14. ජාති භෙද කුල භෙදාදිය නිසා ගුරු ශිෂ්‍ය දෙපක්ෂයේ ම කිසිදු වෙනස් හැඟීමක් පහළ නොකරගත යුතුය.

15. යමකු ඇසුරෙන් කුසල් පිරිහී අකුසල් වැඩේ නම් එබඳු කවරකු වුවද ආශ්‍රය නොකළ යුතු බව වදාළ හෙයින් කැපකරුකමට හෝ පැවිදිකමට පුද්ගලයන් ඇසුරෙන් ආරාම්ක ලජ්ජී පිරිසගේ ලජ්ජී ධර්මය වැනසී යාහැකි හෙයින් පරීක්ෂා කොට භාර ගත යුතු.

16. පිටතින් මෙහි අභ්‍යාසය ලැබීමට පැමිණෙන හෙරණ උපසපන් දෙකොටස පිළිබඳව ද මැනවින් කරුණු විචාරාම සුදුසු භාරකාරාදීන් ඇති විටම ඇතුළත් කරගත යුතුය.

17. "**නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ පාපමිත්තතා**" යි වදාළ හෙයින් සර්වානර්ථයට හෙතු වූ පාපමිත්‍ර ආශ්‍රය විසකුරු සපුන් මෙන් බැහැර කොට, "**සුද්ධා සුද්ධෙහි සංවාසං කප්පයව්හො පතිස්සතා**" යි වදාළ ධර්මයට අනුව තමා ද ලජ්ජීධර්මයෙහි පිහිටා එබඳුවූ ලජ්ජීන් සමගම ධර්මාමිෂ සම්භෝගවල යෙදිය යුතු.

18. කලට සුදුසු පරිදි සිකපද මැඩීමට කිසිවෙකුට කිසි ඉඩක් නොලැබෙන පරිදි පඤ්ච යතික සංගායකාවේදී තබා වදාළ සංඝසඤ්ඤත්තිය සිහිකොට කුඩා මහත් කිසිදු සික පදයක් නොකඩා ප්‍රාතිමොක්ෂ සංවරසීලය රැකිය යුතු.

19. ඉන්ද්‍රිය සංවරය, ආජීව සුද්ධිය, පස් විකුම් සීලය ද හොඳින් අසා බලා දැනගෙන "**කිකීව අණ්ඩං**" යනාදි ගාථාවලින් දැක්වෙන පරිදි හොඳින් රැකිය යුතු.

20. "**වත්තං න පරිපූරෙය්‍ය න සීලං පරිපූරති**" යනාදී ධර්මයන් සිහි කොට ථෙර - මජ්ඣිම නවක හැම භික්ෂූන් ම කුඩා මහත් සියලු වත් පිළිවෙත් හොඳින් දැන උගෙන අනතිමානී වැ අතලස් වැ සම්පූර්ණ කටයුතු.

21. ගොචර - අගොචර - ආචාර - අනාචාර දැවතුම් හා කුහනාදිවර්ජක ප්‍රතිපදා පිළිබඳ වැ දැක්වෙන කරුණු හොඳින් දැන

උගෙන දළුදඬු ගති හා කොහොන්වත් නොපුරා ශාන්ත දාන්ත වූ උජුපටිපන්න භාවයෝ පුරුදු කළ යුත්තාහ.

22. ගම් වැදීම් බණකීම් ආදි අසා කටයුතු ද හොඳින් දැන ගෙන හිතුවක්කාර කම් නොකොට උපාධ්‍යායාදීන්ගේ අවසරය පරිදි ඒ ඒ දෑයෙහි යෙදිය යුතු.

23. නිද්‍රාරාමතා භස්සාරාමතා ගණසඞ්ගණිකාරාමතාදි ශාසන පරිහානි කර ධර්මයන්හි නොයෙදී දෙතිස් කථාවන්ගෙන් තොර වැ අප්පිච්ඡ කථාදි දශ කථාවස්තුවලින් පමණක් ඒ ඒ අවස්ථානුකූල වැ කථා පැවැත්වීමෙහි යෙදිය යුතු.

24. දිනක් පාසා දශධම්මසුත්ත, අනුමානසුත්තා ගත කරුණු හොඳින් උගෙන නිතර මෙනෙහි කළයුතු.

25. පර්යාප්තියෙන් වෙන් වැ ප්‍රතිපත්ති ප්‍රතිවේධ ශාසනත්‍රය වඳ වන හෙයින් ධර්මවිනය පිළිබඳ මනා දැනීමක් ලැබෙන තුරු පර්යාප්ති ධර්මය උද්ග්‍රහණය ද ධාරණය ද කළයුතු.

26. ප්‍රත්‍යය දායකයන්ගේ පිරිත් ආරාධනා ධර්මදේශනාරාධනාදිය සුදුසුසේ සලකා කළ යුතුය. අනනුලෝමික ගිහි සංසර්ගය සිදු නොවන සේද, කුලදූෂණාදියට හසු නොවන සේ ද, ඔවුන් සමග සම්බන්ධය පැවැත්විය යුතු.

27. සිතේ පරිවර්තනය ඉතා සැහැල්ලු හෙයින් ගිහි නොගිහි හැම දෙනකු හා මැ ගෙහසිතපේමයෙන් නුසුදුසු යාළුකම් සාදා නොගත යුතු.

28. විෂභාගයන් හා ද සභාග වුව ද බාල තරුණයන් හා ද රහස්හි නොබිණිය යුතු.

29. "නවට්ටති හස්සෙනෙන - ගන්තුඤ්චෙව නිසීදිතුං,
වත්ථුස්මිං හසනීයස්මිං - මිහිත මත්තන්තු වට්ටති" සි
යු හෙයින් ආරාමයෙහි ද ගමෙහි ද සුදුසු කරුණක් වුවහොත් මඳ සිනාවක් මුත් මහත් කොට හඬ නගා සිනාව නො කළ යුතු.

30. "සෙලලබං අච්චජනෙනන - අප්පමෙනන භික්ඛුනා
කප්පියෙ'පි න කාතබ්බා - ආමිසත්ථාය ලොලතා" සි
යු හෙයින් කැප දෙයෙහි ද ලොල් නොවිය යුතු.

31. දාගැබ් බෝමලු හමඳිමින් ද, ගඳ දුම් මල් පහන් ඈ පුදමින් ද, දාහැටි වළඳමින් ද, පාත්‍ර මත කරමින් ද නොබිණිය යුතු.



32. ගමෙහි මිනිසුන් සමග ප්‍රත්‍යය සම්බන්ධ අඩු පාඩු කම් කිම් ආදි කථාද විෂභාග කථාද නොකළ යුතු.

33. වැඩිමහලු සඟුන් හා ආදර ගෞරව ඇති වැ නැමී සිට හෝ හිඳගෙන කථා කළයුතු. දරුවන් ඇඟ අල්ලා ආදර නො දැක්විය යුතු. අන්‍යයනට බාධා ඇති වන සේ නොහැඳෑරිය යුතු.

34. තමාගේ යන හැඟීම නිසා හෝ හිතවත්ය යන හැඟීම නිසා හෝ අනුන්ට තර්ජනාදිය නොකරනු. වැඩිමහල්ලන් නොවිචාරා නො කළ යුතු දේ දැන නිසිසේ පිළිපැදිය යුතු.

35. ඇතුළත හටගන්නා අධිකරණයක් කිසි ලෙසකින් පිටතට නොදිය යුතු. පිටත ඇතිවෙන අධිකරණ ද ඇතුළත කලහාදිය පහළ වනසේ වැඩ නොකළ යුතු. කිසිම වරදක් ගැන චෝදකයකු වශයෙන් රාජාධිකරණයට නොයා යුතු.

36. ධර්මය පිළිබඳ වූ ද ශාස්ත්‍රය පිළිබඳ වූ ද පැනක් ඉදිරිපත් වූ කල්හි වැඩිහිටියන්ගේ පැවරීමක් නැතිව තමන් ඊට සම්බන්ධ නොවිය යුතු.

37. තීරණයට නොබැසිය හෙන කරුණු ඉදිරිපත් කරගෙන උනුන් වාද විවාද පටලවා නොගත යුතු.

38. "සොභන්තෙවං නරාජානො - මුත්තා මණි විභූසිතා,
යථා සොභන්ති යතිනො - සීල භූසන භූසිතා"
යනු හෙයින් ශීලාභරණයමැ මුත් නානා ප්‍රකාර අඞ්ගභූෂණ පරිෂ්කාර භූෂණාදිය නොකළ යුතු.

39. අත්තකිලමථානු යෝගයට අයත් වන කෂ්ටව්‍රත දුෂ්කරාසනාදිය වර්ජනය,කොට ව්‍යායාමයත් ශරීර සෞඛ්‍යයත් අපේක්ෂා කොට යෝගික ක්‍රම පුරුදු කළ වරද නැති.

40. ගිලන්කම් ආදි සුදුසු කරුණක් නැතිවැ දිනචරියාව කිසි ලෙසකින් කඩ නොකළ යුතු.

41. බැහැර ගමන් නැවැත්විය යුතු. පැහැර හැරිය නොහැකි කරුණක් පැමිණි කල්හි ආරක්ෂකයකු සමග ගොස් නොපමාව පැමිණිය යුතු.

42. සිතේ පහළ වැටීම අධ්‍යාත්ම ගුණ සන්තානයේ වැටීමටද හේතුවන හෙයින් සිත් දුබලකම් ගැන හොඳින් සලකා බලා ඊට පිළියම් කළයුතු.

43. තමා වඩන කම්ස්ථාන හා රකිනා ධුතාඞ්ගාදිය ආචාර්‍ය උපාධ්‍යායාදීන්හට මුත් සෙස්සනට නො දැනෙන සේ කළයුතු.

44. මෙහි නියමිත ව්‍යවස්ථාවන් බිඳිමින් අකීකරුවන ශිෂ්‍යයනට තුන්යළ දක්වා අවවාද කොට වරද ඔහුගේ අත් පොතෙහි සටහන් කළයුතු. නැවැතත් වරදෙහි යෙදේ නම් උපදේශක මණ්ඩලයේ මාර්ගයෙන් ගණයෙන් බැහැර කළයුතු.

45. මහතෙරුන් වුවද ව්‍යවස්ථා උල්ලඞ්ඝනය කෙරේ නම් දඬුවම් පමුණුවා ගත යුතුය.

## වත්

ගාමන්ත සේනාසනයේ ද අරඤ්ඤ සේනාසනයේ ද වාසය කරන පැවිදි තැන් විසින් හොඳින් දැන උගෙන සපුරා ලිය යුතු වත් රාශියක් විනය බන්ධකයෙහි දේශනා කරනලදි. මේ හැම වතක් ම ආදරයෙන් සම්පූර්ණ කිරීම ගුණ සම්පන්න පැරැණි උතුමන්ගේ ප්‍රධාන පුරුද්ද විය. එයින් උන්වහන්සේලාගේ ඥාන විඥාන බලය පුදුම අන්දමින් දියුණු විය. අධ්‍යාත්මික බලයක් දියුණු කිරීමේ වගක් නැති, නිසි ආචාර්‍යෝපාධ්‍යාය සේවනයක් නැති දළ දඬු පුද්ගලයන් වත් පිළිවෙත් යන නාම මාත්‍රයට ද පටහැණි වෙතත්, ගුණයක් නුවණක් දියුණු කරන, අනාගත වගකීමකට බැඳී වැඩ කරන භික්ෂු සාමණේරාදීන් විසින් ඉතා හොඳින් උගෙන නොකඩවා සාදරයෙන් සකස් කොට සම්පූර්ණයෙන් පිරියුතු ගුණ විශේෂයක් වශයෙන් වත් පිළිවෙත් ගැන සැලකීම දියුණු කර ගතයුතු.

පැවිදිකම ලබා ගත් ඇතැමෙක් තමා විසින් කළමනා වත් පිරීමක් ගැන සිතකුදු නොයොදා අනුන්ගෙන් වත් පිළිවෙත් ගැනීමට සූදානම් වෙති. එහෙත් ඔවුන්ගේ අභිමතාර්ථය සිද්ධ නොවේ. නොබෝ කලෙකින් ඔවුහු පිරිහීයති.

ශාසනික පිරිස අන්‍යොන්‍ය සම්බන්ධයෙන්ම සැපවත් ජීවිතයක් ලබා සිටින කොටසෙකි. මේ සම්බන්ධය කැඩී දෙදරා යාමෙන් පරිහානියටත් විපතටත් පත්වන්නාහ. යථොක්ත ශාසනික සම්බන්ධය, ගුරු ශිෂ්‍යයන් කෙරෙහි පියපුත් හැඟීම වැනි වැඩ පිළිවෙළින් දියුණුවීමට ඉඩ සැලසේ. එයින් අන්‍යොන්‍ය සැලකීම සිදු වේ. මහණකම පිළිබඳ සිරිත් විරිත් හා දැනුම් ද හොඳ ඇසුරෙකින් ලබාගත යුතුය. එබඳු සුදුසු ආශ්‍රයක් නො ලද පැවිද්දාගේ දුබලකම් බැලූ බැලූ අතින් පෙනේ. එයින් වැළකී සැහැල්ලු පිරිසුදු චරිත කලාපයකින් තමනුත් සතුටුවී දෙවියන් සහිත ලෝකයාටද සතුටක් සලසාලීමට වත් පිළිවෙත් පිරිය යුතු.



1. ආචාරිය - උපජ්ඣාය වත්
2. අන්තේවාසික-සද්ධිවිහාරික වත්
3. ආගන්තුක වත්
4. ආවාසික වත්
5. ගමික වත්
6. දන්වළඳන තැන වත්
7. පිණ්ඩචාරික වත්
8. ආරඤ්ඤක වත්
9. සේනාසන වත්
10. ප්‍රකීර්ණක වත්

මෙසේ කොටස් 10 කට බෙදා හඳුන්වා දෙමු.

## 1. ආචාර්‍ය – උපාධ්‍යාය වත්

උපාධ්‍යායයන් වහන්සේ නමක් හෝ ආචාර්‍යයන් වහන්සේ නමක් ඇසුරු කොටගෙන වසන සද්ධිවිහාරික අන්තේවාසිකයන් විසින් සිවුර ඒකාංශ කොට පොරවා වැඳ ගෙන "උපජ්ඣායො මෙ භන්තෙ හොහි" යි හෝ, "ආචරියො මෙ භන්තෙ හොහි ආයස්මතො නිස්සාය වච්ඡාමි" යි තුන් යළක් කිය යුතුය. ඒ උපාධ්‍යාය ආචාර්‍යවරයන් විසින් එයට පිළිතුරු වශයෙන් "පතිරූපං" යි කී කල ඔවුන් විසින්, 'සාධු ඔකාස සම්පටිච්ඡාමි' කියා පිළිගත යුතුය. එතැන් පටන් ඔවුන් විසින් "ස්වාමීන් වහන්සේ අද පටන් මට භාරවූහ" යි සලකා පියා යන හැඟීම ඇති කරගත යුතුය.

මෙසේ පැවැතිය යුතුය. කලින් ම නැඟී සිට තමා පසළු වහන් සඟලක් වෙතොත් එය ගලවා තෙරුන් ළඟට ගොස් දැහැටි පිළිගැන්විය යුතුය. මහත්වූ ද මධ්‍යම ප්‍රමාණවූ ද කුඩාවූ ද දැහැටි තුන තුන තුන් දිනක් පිළිගන්වා උන්වහන්සේගේ අදහස් දැන නිති පතා පිළිපැදිය යුතුය. 2. මුව සේදීමට උණු පැන් හා සිසිල් පැන් පිළිගැන්විය යුතුය. තුන් දිනක් මෙසේ පිළිගැන්වීමෙන් නියමයෙන් පිළිගන්නා දෙය දැන ගෙන නිති පතා එසේ පිළිපැද්ද යුතුය. 3. ජලය මුව දෝනා තැන තබා වැසිකිළියේ පටන් ඇමැද ගෙන පැමිණිය යුතුය. තෙරුන් වැසිකිළියට ගිය කල්හි ලැගුම් ගෙය මුළුල්ල හැමදිය යුතුය. මෙසේ කිරීමෙන් ලැගුම් ගෙය හිස් නොවේ. 4. තෙරුන් ශරීරකෘත්‍යය කොට පැමිණි කල්හි කැඳ ආදියක් තිබේ නම් පිළිගැන් විය හැකිය. ආහාරපානාදියක් පිළිගන් වන කල්හි භාජන සෝදා ගත යුතුය. වැළඳූ පසු භාජනය පිළිගෙන එය කිසිවක නොහප්පා මැනවින් සේදිය යුතුය. සෝදා තැන්පත් කළ යුතුය. 5. උන්වහන්සේ ගමට පිඬු පිණිස වඩිනවා නම් සිවුරු පිළිගැන්විය යුතුය. 6. පාත්‍රය සෝදා ජලය සහිතව පිළිගැන්විය යුතුය. 7. තමනුත් සමග යාමට කැමති නම්, තමනුත් හොඳින් හැඳ පෙරව පාත්‍රය ගෙන උන්වහන්සේ නැවැතී බලන

කල්හි පියවරකින් දෙකකින් ලංවිය හැකිසේ නුදුරුව ද, නො ලං වද යා යුතුය. 8. උන්වහන්සේ යමක් පිළිගත් කල්හි පාත්‍රය උණු බව දැනේ නම්, බර බව දැනේනම්, තමාගේ පාත්‍රය උන්වහන්සේට දී ඒ පාත්‍රය පිළිගත යුතුය. 9. ගුරුන් කිසිවකු හා කථා කරන කල්හි අන්තරායක් නැතොත් අතරට කථා නොදැමිය යුතු. (දුකුලාවේ) ඇවැතක් සිදුවීමට හේතුවන කථාවක් කරන කල්හි කාරුණාවෙන් එයින් වළැක්විය යුතුය. 10. ගුරුන් හා පෙරලා එනවිට වෙනකෙකු ඇත්නම් ඔවුන් සමග එන්නට සලස්සා කලින්ම තමා වෙහෙරට පැමිණිය යුතුය. 11. නැත්නම් අතර මඟදී තමන් කල් ඇතිව අවුත් ආසනය සකස් කොට පනවා පැන් තබා සිවුරු පෙරලා ගත යුතුය. 12. සිවුර ඩහදියෙන් තෙමී නම් උණුසුම් තැනක දමා වේලිය යුතුය. සිවුර අව්වේ දැවෙන්නට ඉඩ දිය යුතු නොවේ. සිවුරේ වත දැන ගෙන නැමිය යුතුය. 13. පැන් පිළිගන්වා ආහාර පිළිගැන්විය යුතුය. කල් ඇතොත් ළඟ සිට තුන් යලක් පැන් ගැන විචාළ යුතුය. නැත්නම් සෑහෙන පමණ පැන් තබා තමාගෙ අහර කිස කළ යුතුය. 14. පාත්‍රයේ වත සම්පූර්ණ කළ යුතුය. 15. නැවැත ඒ ස්ථානයත් භාජනාදියත් ශුද්ධ කළ යුතුය. 16. නෑමට කැමැති නම් එය සම්පූර්ණ කළ යුතුය. 17. ගිහිහල් ගෙට වඩිනු කැමැති නම් එහි උපකරණ සපයා දිය යුතුය. 18. ඉගෙනීමට හෝ පිලි විසීමට කැමැති නම් ඒ කළ යුතුය. 19. හැමදීමේ වත සම්පූර්ණ කර ලැගුම් ගෙය ශුද්ධ කළ යුතුය. 20. දොර කවුළු හැරීමද වැසීමද වත දැන කළ යුතුය. 21. ගුරුන්ට අනභි රති - කුකුස් - මිථ්‍යාදෘෂ්ටි- ආපත්ති- දඬුවම් ආදියක් ඉදිරිපත් වුවහොත් ඒවා සුදුසු අන්දමින් සන්සිඳුවා ලිය යුතුය. 22. ගුරුන්ගේ උපාධ්‍යායයන්ගේ විෂභාග පුද්ගලයන් හා නොවිචාරා ගනුදෙනු නොකළ යුතුය. 23. නොවිචාරා විෂභාගයන් කිසිදු වැඩකට සම්බන්ධ නොකර ගත යුතුය. තමාද සම්බන්ධ නොවිය යුතුය. 24. නොවිචාරා ගමට සොහොනට දිශාභාගයකට නොගිය යුතුය. 25. ගිලන්වූ ගුරු උපාධ්‍යායයනට යාව ජීවයෙන් උපස්ථාන කළ යුතුය. වෙනම් උපස්ථායකයකු ඇතොත් බෙහෙත් බඩු සපයාලිය යුතුය.

## 2. අන්තෙවාසික සද්ධිවිහාරික වත්

1. උද්දෙස- පරිපුච්ඡා- අවවාද- අනුශාසනායෙන් සංග්‍රහ කළ යුතුය. එහි උද්දෙස නම් පෙළ පාඩම් කරවීමයි, පරිපුච්ඡා නම් එහි අර්ථකථාව කියා දීමයි, අවවාද නම් කල්තියා කරන දැනුම්



දීමයි, අනුශාසනා නම් වරද දුටුවිට එයින් නිදහස් වීමට කරන කථාවයි, නැතහොත් අවවාද නම් වරදක් ඇතත් නැතත් එක් වරක් කරන අවවාද කථාවයි, අනුශාසන නම් නැවැත නැවැත එය කිරීමයි. 2. පරිෂ්කාර සැපයෙන සැටි සොයා බැලිය යුතුය. 3. පරිෂ්කාර තිබේනම් දිය යුතුය. 4. ගිලන්කල සියලු උපස්ථාන ආදරයෙන් කළයුතු. 5. අනභිරති ආදියකින් පෙළේ නම් ඒවා සංසිඳවිය යුතුය. තමාට ශක්ති නැත්නම් අනුන් ලවා එය කරවිය යුතුය. ආචාර්ය උපාධ්‍යාය වත්හි සඳහන් කරුණු සුදුසුසේ සලකා කළයුතු.

## 3. ආගන්තුකවත්

1. ආගන්තුකව පැමිණෙන්නා උපචාර සීමාවේදීම (විහාරයට පැමිණෙන්ට කලින්) වහන් සඟල ගලවා හෙමින් සිරුවේ ගසා දමා ලීයකින් ඔසවාගෙන ඡත්‍රය අකුළාගෙන හිස වසා නොගෙන දෙපොට සිවුර තමා උරයේ දමාගෙන කලබල නොවී මැනැවින් ආරාමයට වැදිය යුතු. 2. ආරාමයට පිවිස කොතැනක භික්ෂූහු රැස්වෙද්දැයි සොයා බලා සිටින තැනකට ගොස් පාත්‍රය පසෙක තබා සිවුරද තබා සුදුසු අස්නක් ගෙන හිඳ ගත යුතුය. 3. පැන් අසා දැනගෙන කැමැති නම් වැළඳිය යුතුය. පරිභෝගයට ගන්නා ජලය අසා දැනගෙන එක් අතකින් දිය දමමින් අනෙක් අතින් පා සේදිය යුතුය. වතුර දමන්නාවූ අතින්ම පා සේදීම නොකළ යුතුය. 4. වහන් සඟල පිස දමන රෙදි කඩ විචාරා ලබා ගෙන පළමුවෙන් නොතෙත් රෙදි කඩින් එය පිස නැවැත තෙත් කොට පිස දැමිය යුතුය. රෙදි කඩ සෝදා අව්වේ දැමිය යුතුය. 5. ආවාසික භික්ෂුව වැඩිමහලු නම් වැන්ද යුතුය. නැත්නම් වස් විචාරා සිටිය යුතුය. එකල ඔහුගේ යුතුකම සිදුවෙයි. 6. සේනාසනය ගැන විචාළ යුතුය. 7. පිණ්ඩපාතය සඳහා ගම් වදින කාලය විචාළ යුතුය. 8. මිථ්‍යාදෘෂ්ටිකාදීන්ගේ ගෙවල් විචාළ යුතුය. 9. සෙඛ සම්මත කුල විචාළ යුතුය. 10 වැසිකිළි, කෙසගිළි වතුර සැරයටිය පෙරහන්කඩ තබන තැන යන මේවා විචාළ යුතුය. 11. සංඝයාගේ කතිකාවත් විචාළ යුතුය. 12. යායුතු නික්මිය යුතු වේලාව විචාළ යුතුය. 13. කිසිවකු නොවිසූ සෙනසුනක් නම් අගුල හැර දොර විවෘත කොට පිට සිට ගෙන ඇතුළ බැලිය යුතුය. 14. ඇමදීමේ වත ඉටු කළ යුතුය. 15. පාසිවුරු වත් අනුව ඒවා තබාගත යුතුය. 16. දොර කවුළු හැරීමද සුදුසු අයුරු කළ යුතුය. 17. වැසිකිළි ආදිය හැමැදිය යුතුය. 18. පැන් ගෙනවුත් දැමිය යුතුය.

## 4. ආවාසික වත්.

1. ආවාසික භික්ෂුව විසින් වැඩිමහලු ආගන්තුක භික්ෂුවක් එනු දුටු කෙණෙහිම තමා කරමින් සිටින වැඩය නවත්වා ඔහු වෙත එළඹ පැන් තබා පා සෝදන තැන සකස් කොට තබා ඉදිරියට ගොස් පාසිවුරු පිළිගෙන අසුනක් පනවා දිය යුතුය. සැමලු බෝමලු අමදිමින් ගිලනුනට උපස්ථාන කරමින් සිටින්නාද ආගන්තුකයකු දුන ආගන්තුක වත් කිරිමට යායුතුය. නුවණැති ආගන්තුකයා එයට ඉඩ නොදී ඔහු ඒ උතුම් වතෙහි යොදවයි. ගිලනාගේ ගිලන්කම ලොකු නම් එහිම යෙදිය යුතුය. 2. පැන් විචාළ යුතුය. වළඳනු කැමති නම් පිළිගැන්විය යුතුය. පිළිගැන්වූ සියල්ල පානය කළා නම් තවද විචාරා පිළිගැන්විය යුතුය. 3. වැඩහුන් ආගන්තුකයාට විජිනි පත ගෙන පවන් සැලිය යුතුය, පවන් සලනවිට ප්‍රථමයෙන් පාපිටට වරක් ද, මැදට වරක් ද, හිසට වරක්ද යි මෙසේ පවන් සැලිය යුතුය. "දුන් ඇතැ" යි කී කල හෙමින් පවන් සැලිය යුතුය. දෙවෙනිවර එසේ කීවිට ඊටත් වඩා වේගය අඩුකොට කළ යුතුය. තුන්වනවර එසේ කීවිට විජිනි පත තැබිය යුතුය. පා සේදිය යුතුය. පිසදමා තෙල් ගෑල් විය යුතුය. වහන් සඟල් පිස දැමීම තමා කැමැති නම් කළ යුතුය. 4. වැන්ද යුතුය. 5. 'මට ලැබෙන සේනාසනය කොහිදැ' යි විචාළ කල්හි සෙනසුන සඳා, "ස්වාමීන් වහන්සේගේ සෙනසුන මේ" ය යි දැන්විය යුතුය. 6. ගොචර අගොචරාදිය දැන්විය යුතුය. 7. ආගන්තුකයා නවක නම් පැන් ආදි සියල්ල පෙන්වා 'එයින් ප්‍රයොජන ගන්නැ'යි දැන්විය යුතුය. දැනුම් දියයුතු දෑ පෙර මෙන් කළ යුතුය.

## 5. ගමික වත්.

1. ගමිකයා විසින් තම සෙනසුනෙහි ඇති ලීබඩු මැටිබඩු ආදි සියල්ල වේයන් මීයන්ගෙන් ආරක්ෂාවන අන්දමින් තැන්පත් කොට භික්ෂුවක් හෝ සාමණේර නමක් හෝ ආරාමිකයකු හෝ සිටිනා කෙනකුට දන්වා යා යුතුය. 2. වේයන්ගෙන් විපත් ඇතොත් ගල් සතරක් උඩ ඇඳ පුටු ආදිය තැබිය යුතු.



## 6. දන් වළඳන තැන වත.

ගමෙහි හෝ විහාරයෙහි හෝ මිනිසුන් දන් පිළිගන්වන තැනදී හැසිරිය යුතු ආකාරය දතයුතු. 1. කාලය දැන්වූ කල්හි (ගෙඩිය ගැසූ කල) පරිමණ්ඩලව හැඳ පටිය බැඳ සිවුරු පොරවා ගැට වටු දමා සේදූ පාත්‍රය අතින් ගෙන කලබල නොවී හොඳින් ගමට පිවිසිය යුතුය. 2. මහතෙරුන් යන මාර්ගයෙන් ඉවත් වී ඔවුන් ඉදිරියේ නොයා යුතුය. 3. සේඛියාවේ කී සෙසින් යා යුතුය. 4. මහතෙරුන් හා එකට හැපී නොඉන්ද යුතුය. මහතෙරුන් හුන් අස්නට සමාන ආසන වේ නම් ආසන එකක් දෙකක් හැර අස්නක හිඳ ගත යුතුය. ආසන භික්ෂූන් ගණනටම තිබේ නම් උස් නම්, සමාන නම් මහතෙරුන් ළඟ සිටගෙන ස්වාමීනි! මෙය උසයයි කිය යුතුය. මහතෙරුන් 'හිඳගන්නැ'යි කීකල්හි හිඳ ගත යුතුය. මේ කීකල්හි ද මහතෙරුන් කිසිවක් නොකියා නම් තමා හිඳගත යුතුය. වරද මහතෙරුන්ට මය. 5. අලුත් භික්ෂූන් අස්නෙන් අහක් නොකළ යුතුය. 6. සංඝාටිය නොම ඔසවා නොහින්ද යුතුය. 7. දායකවරු පාත්‍රය සේදීමට ජලය ගෙනා කල්හි දෑතින් පාත්‍රය අල්ලා ගෙන ජලය පිළිගත යුතුය. 8. හඬ නොනගින සේ හෙමින් පාත්‍රය සෝදා එම ජලය දැමීමට භාජනයක් වේ නම් හෙමින් එහි වත්කළ යුතුය. එබන්දක් නැති නම් සුදුසු තම් බිම වත්කළ යුතුය. අනුන් නොතෙමෙන සේය. 9. බත් බෙදන කල්හි දෑතින් පාත්‍රය අල්ලාගෙන ඒ පිළිගත යුතුය. හොඳින් තැබූ ආධාරකයේ පාත්‍රය තබා බත් බෙදන කල්හි අත තබා ගැනීමද සුදුසුය. සූපවලට ඉඩ ඇතිව බත් ගත යුතුය. 10. බෙදනු ලබන දෙය අඩු නම් 'සමව සපයන්නැ'යි කියයුතු. නැතිනම් දෙතුන් වරකට වඩා නොගත යුතුය. 11. මෙබඳු තැනක සියල්ලවුනට පිණ්ඩපාතය බෙදන තුරු මහතෙරුන් නොවැළඳිය යුතු. භික්ෂූන්ගේ පැමිණීමත් වැළඳීමත් කිප විටකදී සිදුවන මහාදානස්ථානයන්හි පිසිසේ වැළඳිය යුතුය. පිණ්ඩපාතය පූජා කොට අවසානයෙහි වැඳීමට බලාපොරොත්තුවන සුළු තැන්වල අවසන් කොට බෙදන තුරු සිටිය යුතුය. 12. පිණ්ඩපාතය වැළඳීම සේඛියාවේ දැක්වූ සේ කළයුතු. 13. දන් ගන්නා සාමාන්‍ය තැන්හිදී සියලු භික්ෂූන් වළඳා අවසාන වනතුරු අත් ශේනා ජලය නොගත යුතුය. අවශ්‍ය නම් පැන් බීම කළ යුතුය. අත් සෝදන පැන් දෙන කල්හි අත් දෙකින් පාත්‍රය අල්ලා ගෙන එය ගත යුතුය. දායකයන්, ස්වාමීනි අත් සෝදා ගත මැනැවැයි කියන කල්හි භික්ෂූන් අවසන් නොවූමත් එසේ කිරීම වටියි. 14. පාත්‍රයට ජලය ගෙන එය හෙමින් සේදිය

යුතුය. ජලය දැමීමට භාජනයක් තිබේ නම් එහි දැමිය යුතුය. නැති නම් පරීක්‍ෂා කොට බිමට දැමිය යුතුය. මේ ක්‍රියාවලදී තමාගේ සිවුරුත් අනුනුත් බිමත් රැකෙන ලෙස පිළිපැදිය යුතුය. 15. ඉඳුල් බත් සහිත ජලය ගමෙහි නොදැමිය යුතු. 16. සම්බාධ ස්ථානයන්හි සිට හැරී විහාරයට වඩිනා කල්හි නවකයන් ප්‍රථමයෙන් ගෙයි දොරටුව දෙසට යා යුතුය. මහතෙරුන් නික්ම ගොස් පෙරටුව ගත් කල්හි මිනිසුන්ට අතරින් යාහැකි වන තරමේ තුනිම සැදී පෙළ ගැසීමෙන් යුක්ත වැ යායුතුය. නවකයන් ඇතුල්ගෙයිත් මහතෙරුන් දොර ළඟත් හිඳිනා කල්හි මහතෙරුන්ගේ පටන් යායුතුය. 17. සේඛියාවත් පුරා යායුතුය.

## 7. පිණ්ඩචාරික වත.

1. පිණ්ඩචාරික භික්ෂුව විසින් ගම්වැදීමට පෙරටුව තෙමඬුලු වසා අඳනය හැඳ පටිය බැඳ සඟල සිවුරු එක්කොට පොරවා ගණ්ඨිය දමා සෝදන ලද පාත්‍රය ගෙන මැනවින් ඉක්මන් නොවී ගමට යායුතු. 2. එහිදී සේඛියාවේ දැක්වූ ලෙස ගමන් කළ යුතුය. 3. ගෙයක් ළඟට යන කල්හි ඇතුල් වන්නේ මෙසේය නික්මෙන්නේ මෙසේ යයි සැලකිය යුතුය. 4. ඉක්මන් නොවිය යුතුය. 5. හොඳටම ළඟ නොසිටිය යුතුය. 6. හොඳටම දුරින් නොසිටිය යුතුය. 7. බොහෝ වේලාවක් නොසිටිය යුතුය. 8. ඉක්මනින් පෙරළා නොයා යුතුය. 9. භික්ෂාවක් දෙනු කැමැතිද නැද්ද යි සැලකිය යුතුය. 10. කරන වැඩ නවතයි නම්, අසුනෙන් නැගී සිටී නම්, හැඳි භාජන ආදිය අතපත ගානම් දෙනු කැමැති බවයි. 11. භික්ෂාව දෙන කල්හි වමතින් සඟල සිවුර අහක්කොට දකුණතින් පාත්‍රය එළියට හරවා දෑතින් ම පාත්‍රය අල්ලාගෙන පිණ්ඩපාතය පිළිගත යුතුය. භික්ෂාව දෙන ස්ත්‍රී පුරුෂයන්ගේ මූහුණ නොබැලිය යුතුය. සූපයක් දෙනු කැමැතිද නැද්දැයි පෙර මෙන් සලකා බැලිය යුතුය. 13. භික්ෂාව ලැබුණු පසු මැනැවින් සංඝාටියෙන් පාත්‍රය වසා ගෙන හැරී ආ යුතුය. 14. ගමේ ගමන පෙර මෙන් සේඛියාවේ දැක්වූ සේ කළ යුතුය. 15. ප්‍රථමයෙන් බොජුන් හලට වන් භික්ෂුව විසින් අසුන් පනවා පැන් එළවා එහි සියලු කට යුතු සැපයිය යුතුය. ඉතිරි අහර දමන අවක්කාර පාතිය සෝදා එළවා තබා එයට වැඩි දේ දමා භොජන කෘත්‍යය කළයුතු. 17. පසුව එන තැනැත්තාද තැන්පත් කොට තැබූ ආහාර කැමති නම් ගත යුතු. නැත්නම් තණකොළ නැති බිමක හෝ ප්‍රාණීන් නැති



ජලයෙක්හි හෝ දැමිය යුතුය. 18. ආසන තැන්පත් කිරීමාදිය ඔහු විසින් කළ යුතුය. 19. තනිව කළ නොහැකි වැඩෙක් වේ නම් අතින් අතිකෙකු කැඳවා කථා නොකර ඒ වැඩේ ඔහු සමඟ කළ යුතුය.

## 8. ආරඤ්ඤක වත.

1. ආරණ්‍යක භික්ෂුව විසින් කල් ඇතිව පාත්‍රය ථවිකාවේ දමා උරයේ එල්ලාගෙන, සිවුර උරමත දමා ගෙන, ලී - මැටි බඩු තැන්පත් කොට දොර කවුළු වසා වාසය කරන සේනාසනයෙන් පිටත් විය යුතු. 2. ගමට ළඟදී වහන් සඟළ ගලවා දූවිලි ගසා දමා ථවිකාවේ දමා ගෙන ඇලයක එල්ලා මැනවින් හැඳ පෙරව ගණ්ඨිපාස දමා සේදූ පාත්‍රය අතින් ගෙන ඉක්මන් නොවී සේඛියාවේ දැක්වූ ලෙස ගමේ හැසිරිය යුතු. 3. පිණ්ඩපාත වතේ දැක්වූ අයුරින් එහි යෙදිය යුතුය. 4. ගමින් බැහැර පැන් නැත්නම් ගමේ දීම ආහාර කෘත්‍යය කළ යුතුය. 5. පිට ගමේ පැන් තිබේ නම් එහිදී ආහාර කෘත්‍යය කොට පාත්‍රය සෝදා පිස දමා ථවිකාවේ දමා අංශයේ එල්ලා ගෙන සුවුර හකුළා හිස මතුවෙහි දමා ගෙන වහන් පයලා යා යුතුය. 6. ආරණ්‍යක භික්ෂුව විසින් පැන් දෙවගී යම සපයා තැබිය යුතුය. භාජන හිඟ නම් පරිභොග ජලය වෙනුවට පිය යුතු වතුරම සැපයිය යුතුය. භාජන නැත්නම් උණ නළ වලට වතුර පුරවා තැබිය යුතුය. එයද කළ නොහැකි නම් ජලාශයක් අසළ නැතිය යුතුය. 7. අරණ්‍යවාසීවූ ද, කාන්තාරයට පැමිණියාවූ ද භික්ෂුවට ගිනි සපයා ගැනීමට උපකරණ ළඟ තිබිය යුතුය. 8. සැරයටියක් තිබිය යුතුය. 9. නැකැත් - වාර - තිපි යන මේවා සවල්ප වශයෙන් හෝ පෘථුල වශයෙන් දත යුතු. 10. දිශා ව්‍යවස්ථාව තිබිය යුතුය. 11. සංඝයා අතර වසන කල්හි සබ්‍රම්සරුන් කෙරෙහි ගරු පැවතුම් ඇතිවිය යුතු. 12. ස්ථවිර භික්ෂූන් සලකා වැඩ කළ යුතුය. 13. ආසනයෙහි දක්ෂ විය යුතුය. 14. දවල්වී ගමට නොගිය යුතුය. 15. බොහෝ කල් ඉක්මවා ගමින් පිටත්වීම නොකළ යුතු. 16. ගෙවල්වල නොගැවසිය යුතුය. 17. උඬගු නොවිය යුතු. 18. මුඛර නොවිය යුතු. 19. කල්‍යාණ මිත්‍ර විය යුතුය. 20. ඉන්ද්‍රිය සංවරය ඇතිවිය යුතු. 21. භොජනයෙහි පමණ දන්නකු විය යුතු. 22. ජාගරියානු යොගය තිබිය යුතුය.

23. කුසීත නොවිය යුතුය. 24. සිහි ඇති විය යුතුය. 25. සමාධිමත් විය යුතු. 26. ප්‍රාඥ විය යුතුය. 27. අභිධර්ම අභිවිනයයන්හි දක්ෂ විය යුතුය. 28. රූපාරූපධ්‍යාන හා කසින පරිකර්ම පුහුණුව තිබිය යුතුය. 29. මාර්ගඵලභාවනාදිය පිළිබඳ දැනුම තිබිය යුතුය. (මජ්ඣිම-ගුලිස්සානි)

## 9. සේනාසනවත.

1. තමා වාසය කරන ආවාස ගෘහය පිරිසුදු කිරීම සුදුසුය. ශුද්ධ කරන කල්හි පාසිවුරු වෙනම ද කොට්ට ආදිය වෙනම ද බැහැර තැන්පත් කළ යුතුය. 2. ඉහළ පටන් ශුද්ධ කළ යුතුය. 3. කවුළු පිස දැමිය යුතුය. 4. සායම් ගෑ බිත්තිය නම් තෙමූ රෙදි කැබැල්ලකින් පිරිමැදිය යුතුය. 5. මැටි ගෑ බිම නම් වතුර ඉසිය යුතුය. 6. භාණ්ඩ ගසා දමන කල්හි අනෙක් ආවාස හා පැන් බඳුන් අපිරිසිදු නොවන සේ කළ යුතුය. 7. නැවත බුමුතුරුණු පෙර තුබූ ලෙසින් එළිය යුතු. 8. ඇඳ පුටු තුබූසේ පැනවිය යුතු. 9. ඇතිරිලිද එසේම වේලා දැමිය යුතුය. 10. දූවිලි සහිත සුළඟ එන දිශාවේ ජනෙල් වැසිය යුතු. 11. උපස්ථානශාලාදියද හැමදිය යුතු. 12. වැඩිමහල්ලකු සමග එක ආවාසයේ වසනවා නම් ඔහු නොවිචාරා උදෙසය නොදිය යුතු. 13. පරිපුච්ඡා - සජ්ඣායන - පහන් දැල්වීම - නිවීම - ජනෙල් වැසීම යන මේවා විචාරා කළයුතු. 14. ඔහු සමග සක්මන් කරන කල්හි සිවුරු කොනක් පවා ඇගේ නොගෑවෙන සේ එය කළ යුතුය. භොජන ශාලාදියෙහි ද එසේ පිළිපැදිය යුතුය.

## 10. ප්‍රකීර්ණකවත්.

**i අනුමෝදනාවත-** සංඝස්ථවිරයන් විසින් අනුමෝදනාව කළ යුතුය. 2. ඔවුන් අනුමෝදනාවට හුන් කල්හි එයින් යට පිළිවෙළින් සතර පස් නමක් නැවැතී සිටිය යුතුය. 3. පස්වැනියා අනුමෝදනාවට හුන් කල්හි එතැන පටන් ඉහලට සතර නමක් නැවැතිය යුතුය. 4. බාල නමක් හුන් කල්හිද මහතෙරුන් පටන් සතර නමක් නැවැතිය යුතුය. 5. ඔහු 'සවාමීනි! වැඩිය මැනැවැ'යි කියතොත් යාම සුදුසුය. 6. මහතෙරුන් 'අපි යන්නෙමු' යයි කී කල්හි 'යනු මැනැවැ'යි කියතොත් යාම වරද නැත. 7. ගමින් පිටදී හමුවන්නෙමැයි සලකා පිටවී ගොස් එහිදී තම අතවැසියනට 'ධර්මකථිකයා හමුවී එන්නැ'යි දන්වා යෑම ද වරද නැත. 8. මිනිසුන්ගේ ආරාධනාවක් ගෙන එහිදී අනුමෝදනාව කරන්නාට වරද



නැත. මහතෙරුන්හට භාරවන්නේ ද නොවේ. උපනිසින්න කථාවේදී මය මහාජනයා කථාකරවන කල්හි මහතෙරුන් විචාළ යුත්තේ, මහතෙරුන් නියම කළ යුත්තේද එහිදී මය. අනුමෝදනාව කරන කල්හි නැවැතී සිටි අයටද ළඟ සිටින භික්ෂුවකගෙන් විචාරා ගිය හැකිය. **ii සිවුරුවත.** 1. තුන් සිවුර භික්ෂුවගේ ආභරණයයි. එය කපා මැසූ පඬු පෙවූ කැප පිරිකරෙකි. 2. දෙපොට සිවුර නිතරම සුරක්ෂිතව තබාගත යුතුය පිණ්ඩපාත අවස්ථාවේදී ද එය රැකගන්නා සැටි කියන ලදී. 3. ඩහදිය තිබේ නම් අවුගස්සා ගත යුතුය. 4. අව්වේ වේලෙන්නට බොහෝ වේලාවක් නොදැමිය යුතුය. 5. වැලක දමන කල්හි ඒ වැලේ කොනක සිට අනෙක් කොන දක්වා අතගාගෙන යායුතුය. මෙසේ දෙවරක් පමණ කොට එය එහි දැමිය යුතුය. 6. එය නමන කල්හි දිනපතා එක තැනකින් නැමෙන සේ නොනැමිය යුතුය. 7. එහි ගණ්ඨිපාස - ජම්ඛසය - ගීවෙය්‍ය තිබිය යුතුය. **iii පාත්‍රවත.** පාත්‍රය දූවිලි නොවදින සේ තබාගත යුතුය. 2. සෝදන විට බිමට පහත් කොට එය කළ යුතුය. 3. එය පුටු, ඇඳ, මේස ආදියක් උඩ නොතබනු. 4. පාත්‍රය අතින් ගෙන දොර ආදිය නැරිය යුතුය. 5. පාත්‍රය පිට පාත්‍රය තබාගෙන නොයා යුතුය. 6. පාත්‍රය අව්වේ නොදැමිය යුතුය. 7. අව්වෙන් රත්කර ගත යුතුය. 8. එක් පාත්‍රයක් පාවිච්චි කළ යුතුය. 9. එහි සිදුරු තිබේ නම් ඉටි ආදියෙකින් ඇහිරිය යුතුය. මෙසේ කළ ඇහිරීම් පසකට අඩුව තිබෙද්දී වෙනින් පාත්‍රයක් නොගත යුතුය. 10. ඉතා කුඩා පාත්‍රයද ඉතා ලොකු පාත්‍රයද නොගත යුතුය. **iv නානවත.** 1. නැමේදී නවකයන් නොපෙලිය යුතුය. 2. තෙරුන් නොගැටිය යුතුය. 3. පිළිවෙළින් යායුතු නොවේ. 4. ගස් - කණු - බිත්ති ආදියක ඇඟ නොගැටිය යුතුය. වස්ත්‍ර වැටියකින් හෝ අතින් හෝ ඇඟ ඉලිය යුතුය. 5. සමේ රෝග ආදියක් තිබේ නම් එයට නිසි අවුසද ජාතියෙන් සෑදූ සුණු ආදිය යෙදිය යුතුය. 6. සමේ පාට වැඩිකර ගැනීමට එය නොකල යුතු. **v නිස්සයවත.** ආචාර්‍ය උපාධ්‍යායයන් ආශ්‍රයෙන් සිටින්නා විචාරා කළමනා දෑ කළයුතු. එය ඒ ඒ තැන් වල දක්වා ඇත. ඔවුන්ගෙන් වෙන් වෙන් ව පිට ගොස් දිනයක් වත් ගත කලා නම් නැවැතත් සමාදන් විය යුතුය. **vi වච්චකුටි-පස්සාවකුටිවත්.** 1. වැසිකිළියෙ ජලය තැබිය යුතුය. 2. පුසන් කූර තැබිය යුතුය. 3. කටවසා තැබිය යුතුය. 4. එහි ඇතුල්වීම කලින් කාරා ශබ්දකොට ඇතුල්විය යුතු. 5. පිටත සිට සිවුරු උස්සාගෙන ඇතුල් නොවිය යුතුය. 6. පාදුකාවේ සිටගෙන එසවිය යුතු. මේ කෙකරුණ පස්සාවකුටියටද සමානයි. 7. වැසිකිළියේදී

කතනමින් කෘත්‍යය නොකළ යුතුය. 8. පුසන්කුරෙන් පිඬුදැමිය යුතු. 9. ආචමනයේ දී ශබ්දය නොවිහිදෙනසේ ද ජලය නොඉ-සෙනසේ ද එය කළ යුතුය. 10. පුසන්කුරු වලේ නොදැමිය යුතුය. 11. වර්චස් පිටත නොදැමිය යුතුය. 12. අනුන්ගෙන් හෝ තමන්ගෙන් පිටත ගෑවී ඇති ඒවා සෝදා දැමිය යුතුය. 13. පස්සාව පාදුකාවේ කෙළ නොගැසිය යුතුය. 14. ඉක්මනට මේවා නොකළ යුතුය. 15. සිවුරු දමහා ලනු ආදියක සිවුර දමා වැසිකිළියට වැදිය යුතුය. 16. දැහැටි කමින් කෘත්‍යය නොකළ යුතු. 17. රළු පුසන්කුරු නොගත යුතු. 18. වැසිකිළි- කැසගිළි කෘත්‍යය කොට නැගිට අඳනය පහත දමා එයින් ඉවත්විය යුතු. 19. ආචමනයට ගත් ජලය භාජනයේ ඉතුරු නොකළ යුතුය. (සාධාරණ තැනේදී පමණයි.) 20. රෝගයකින් පෙළෙනවිට වරද නැත.

---